---

**පුත්තලම ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 මාර්තු 13 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, පුත්තලම ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

සණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද ගොඩනැගිලි 05ක, වටිනාකම වූ රු.5,070,362ක්ද, කන්දකුලිය පෙර පාසල් ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.319,879ක් හා පරිත්‍යාග වශයෙන් ලද රු.72,675ක් වටිනා පොත් තොගයක් ද ස්ථාවර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 98,394,287ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,892,876ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,433,342ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයන් 06කට අදාළ ශේෂයන්ගේ එකතුව රු.10,200,319ක් වූ අතර, එම විෂයයන්ට අදාළව පවත්වා තිබූ ලේඛනවලට අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.11,014,486ක් වූයෙන් රු.1,406,455ක වෙනසක් ගිණුම්වල දක්නට ලැබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට සභාව විසින් ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,059,440ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.3,191,281ක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,731,252ක් වූ අතර, අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.7,954,786ක් විය.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂය රු.1,850,923ක් වූ අතර, සේවය හැරගිය, ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය සේවකයන් 14

දෙනෙකුගෙන් අයවිය යුතු රු.45,844ක ණය ශේෂය වසර ගණනාවක සිට අය නොවී හිඟව පැවතුණි.

(ඉ) 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා අවලව පවතින ලැබිය යුතු ගිණුම් ශේෂයන් හි අගය රු.691,906ක් විය.

(ඊ) පහත සඳහන් බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අතරඳවාගෙන තිබුණි.

| | | රු. |
|---|---|---|
| (i). | එකතු කළ අගය මත බදු | 1,912,830 |
| (ii) | ජාතිය ගොඩනැඟීමේ බදු | 333,971 |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 1,077 | 1,146 | -- |
| (ii) බදු කුලී | 3,737 | 5,803 | -- |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,311 | 2,311 | -- |
| (iv)වෙනත් ආදායම් | 36,753 | 34,671 | 2,082 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,000,000 |
| (ii) | මුද්දර ගාස්තු | 22,419,258 |

**2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

වටිනාකම රු.830,555ක් වූ මෝටර් රථ වාහන උපකරණ විෂයයන් 14 ක් වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

**2.5 අවිධිමත් ගනුදෙනු**

2012 ලෝක ළමා දින උත්සවය සඳහා සකස් කල රු.467,000ක වියදම් ඇස්තමේන්තුවෙන් රු.200,000ක් දක්වා සභා අරමුදලින් දැරීමටත් ඉතිරි මුදල අනුග්‍රාහක පාර්ශවයන්ගෙන් ලබා ගැනීමටත් පළාත් පාලන කොමසාරිස්වරයා දුන් අනුමැතියට පටහැනිව එම සීමාව ඉක්මවා රු.186,745ක මුදලක් කිසිදු අනුමැතියකින් තොරව සභා අරමුදලින් වැයකර තිබුණි.

**2.6 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය